සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education, Southern Province

21 | S | II

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
## கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
## General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

12 ශ්‍රේණිය
Grade 12

ආර්ථික විද්‍යාව - II
Economics - II

පැය දෙකයි
Two hours

**සැලකිය යුතුයි :**
- **ප්‍රශ්න 4ක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

(01) i. ව්‍යවසායකත්වයේ නිශ්චිත කාර්යයන් කවරෙක් ද? (ලකුණු 4)

ii. අ) ''ඵලදායිතාව'' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 2)

ආ) ''ඵලදායිතාව වැඩිවීම'' දැක්විය හැකි ආකාර 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

iii. x හා y යන භාණ්ඩ නිෂ්පාදනය කරන සරල ආර්ථිකයක x ඒකක 100 නිෂ්පාදනය කරන විට y භාණ්ඩ නිෂ්පාදනය ශුන්‍ය වේ. y ඒකක 2 බැගින් වැඩිකිරීමට x ඒකක 20 බැගින් කැප කළ යුතුය.

අ) නිෂ්පාදන හැකියාව ලේඛනයකින් ඉදිරිපත් කර ඊට අදාල නිෂ්පාදන හැකියා මායිම ගොඩනගන්න. (ලකුණු 2)

ආ) x භාණ්ඩය නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ගණනය කරන්න. (ලකුණු 2)

ඉ) ආර්ථිකය x ඒකක 60ක් හා y ඒකක 8ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත. මෙම සංයෝගය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ ලකුණු කර A යනුවෙන් නම් කරන්න. (ලකුණු 1)

ඊ) මෙම භාණ්ඩ සංයෝගය පරිභෝජනය කිරීමට ආර්ථිකයට ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 2)

iv. ''ආර්ථිකයක් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේදී ප්‍රාග්ධන භාණ්ඩ හා පරිභෝජන භාණ්ඩ අතර කරනු ලබන තේරීම මත අනාගත ආර්ථික වෘද්ධියේ ස්වරූපය තීරණය වේ.'' සුදුසු ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(02) i. ආර්ථික විද්‍යාවට අනුව සෑම සමාජයක් විසින්ම විසඳාගත යුතු ''මූලික තේරීම් තුන'' මොනවාද? එම තේරීම් තුන සෑම සමාජයකටම පොදු ඒවා වන්නේ ඇයි? (ලකුණු 4)

ii. ''කුටුම්භයක්'' යනු කුමක් ද? කුටුම්භ විසින් ගනු ලබන ප්‍රධාන ආර්ථික තීරණ මොනවා ද?(ලකුණු 4)

iii. ආර්ථික පද්ධති වර්ග කිරීම සඳහා භාවිතා කෙරෙන ප්‍රධාන නිර්ණායක 4ක් සඳහන් කරන්න. එම නිර්ණායක සියල්ලම සැලකිල්ලට ගෙන පොදුවේ ආර්ථික පද්ධති වර්ග කෙරෙන ආකාර මොනවා ද? (ලකුණු 4)

iv. වෙළඳපොළ ආර්ථිකයක මිල යාන්ත්‍රණය මගින් විකල්ප ප්‍රයෝජන අතර සම්පත් බෙදීයන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. නූතනයේ දක්නට ලැබෙන මිශ්‍ර ආර්ථික පද්ධතිවල ප්‍රධාන ස්වරූප දෙක සඳහන් කොට සම්පත් හිමිකාරීත්වය හා සම්පත් භාවිතය පිළිබඳ තීරණ ගැනීම සම්බන්ධයෙන් එම ආර්ථික අතර පවතින ප්‍රධාන වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

(03) i. ඉල්ලුම් නීතිය ගොඩනැගීමේදී යොදා ගන්නා උපකල්පන කවරේ ද? (ලකුණු 2)

ii. භාණ්ඩයක ''ඉල්ලුම ප්‍රසාරණය'' හා ''ඉල්ලුම අඩුවීම'' එකිනෙකට ප්‍රතිවිරුද්ධ සංකල්ප දෙකකි. එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. එක්තරා භාණ්ඩයක් සම්බන්ධ සතියක් තුළ වෙළඳපොල දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|
| 2.00 | 80 |
| 4.00 | 60 |

අ) ඉහත ලේඛනයට අදාල ඉල්ලුම් සමීකරණය ගොඩනගන්න. (ලකුණු 2)

ආ) මිල රුපියල් 6.00 දී පාරිභෝගික පැහැදම ගණනය කරන්න. (ලකුණු 2)

iv. කිසියම් භාණ්ඩයක් සම්බන්ධ ඉල්ලුම් හා සැපයුම් සමීකරණය පහත දැකවේ.

$Qd = 40-2p$ (ඉල්ලුම් සමීකරණය)

$Qs = -50 + 4p$ (සැපයුම් සමීකරණය)

අ) ඉහත ඉල්ලුම් සැපයුම් සමීකරණය උපයෝගී කොටගෙන සමතුලිත මිලේදී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 4)

v. තරගකාරී වෙළඳපොලක කිසියම් භාණ්ඩයක් සම්බන්ධ තොරතුරු දී ඇතැයි සිතන්න.

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|
| 5.00 | 15 |
| 15.00 | -15 |

අ) ඉහත ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සරල රේඛීය වේ. ප්‍රස්ථාර සටහනක් ඇඳ සමතුලිතය දක්වන්න (ලකුණු 2)

vi. ''වෙළඳපොල සමතුලිතයක් ඇතිවීමට අවම සැපයුම් ප්‍රමාණය, උපරිම ඉල්ලුම් ප්‍රමාණයට වඩා වැඩිවිය යුතුය. ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 4)

(04) i. උපරිම මිල නියම කිරීම, අවම මිල නියම කිරීම යන සංකල්ප අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 2)

ii. මිල පාලනය ඔස්සේ ආණ්ඩුව වෙළඳපොල ක්‍රියාවලියට මැදිහත් වීමේදී භාණ්ඩ හිඟයක් පැවතුනු විටක සලාක කිරීමේ කාර්ය සිදුකරන මිල නොවන මාධ්‍යයන් කවරේ ද? (ලකුණු 2)

iii. අවම මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේදී හටගන්නා ආර්ථික අකාර්යක්ෂමතාවයනට තුඩු දෙන අහිතකර ප්‍රතිවිපාක සඳහන් කරන්න. (ලකුණු 4)

iv. තරගකාරී වෙළඳපොලක අලෙවිවන එක්තරා භාණ්ඩයක් පිළිබඳ ඉල්ලුම් සැපයුම් තොරතුරු පහත ලේඛණයෙහි දැක්වේ. ඉල්ලුම් සැපයුම් වක්‍ර සරල රේඛීය වේ.

| මිල (රු.) | ඉල්ලුම්කරනු ලබන ප්‍රමාණය (ඒකක) | සැපයුම්කරනු ලබන ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 6 | 60 | 20 |
| 12 | 30 | 50 |

අ) ඉල්ලුම් සැපයුම් වක්‍ර නිර්මාණය කර සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය දක්වන්න. (ලකුණු 2)

ආ) මෙම භාණ්ඩ අලෙවියේදී සැපයුම්කරුවන්ට රුපියල් 2.00 ඒකක බද්දක් රජය විසින් පනවනු ඇත. බද්දෙන් පසු තත්ත්වය ප්‍රස්ථාර සටහනෙහි නිර්මාණය කර ගැනුම්කරුවන්ගේ මිල හා සැපයුම් කරුවන්ගේ මිල දක්වන්න. (ලකුණු 2)

ඉ) බද්ද පැනවීම නිසා පාරිභෝගිකයන්ට හා නිෂ්පාදකයාට දැරීමට සිදුවන බදු බර ගණනය කරන්න. (ලකුණු 2)

ඊ) බදු පැනවීම නිසා පාරිභෝගික අතිරික්තයේ සහ නිෂ්පාදන අතිරික්තයේ සිදුවී ඇති වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 2)

උ) බද්ද පැනවීම නිසා ආර්ථිකයට අහිමිවන ශුද්ධ ශුභ සාධනය (අධිබදු බර) කොපමණ ද? (ලකුණු 2)

(05) i. තරඟකාරී වෙළඳපොලක අලෙවිවන භාණ්ඩයකට අදාල ඉල්ලුම් සැපයුම් වක්‍ර වලට අදාල තොරතුරු පහත දක්වේ.

| මිල (රු.) | ඉල්ලුම්කරනු ලබන ප්‍රමාණය (ඒකක) | සැපයුම්කරනු ලබන ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 10 | 400 | 0 |
| 35 | 150 | 250 |

අ) ඉල්ලුම් හා සැපයුම් වක්‍ර සරල රේඛීය යැයි උපකල්පනය කොට වෙළඳපොල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ව්‍යුත්පන්න කරන්න.

ආ) සමීකරණ භාවිතයෙන් සමතුලිත මිලේ දී නිෂ්පාදන අයභාරය ගණනය කරන්න.

ඉ) ආණ්ඩුව නිෂ්පාදකයන්ගේ විචල්‍ය පිරිවැය අඩුකර ගැනීම සඳහා රුපියල් 10 ක ඒකක සහනාධාරයක් ලබාදෙනු ඇත. නිෂ්පාදක සහනාධාරය නිසා භාණ්ඩයට ගැනුම්කරුවන්ට ගෙවීමට සිදුවන මිලත්, නිෂ්පාදකයන්ට ලැබෙන මිලත් ගණනය කරන්න.

ඊ) නිෂ්පාදක සහනාධාරය සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය ගණනය කරන්න.

උ) නිෂ්පාදක සහනාධාරය නිසා නිෂ්පාදන අතිරික්තය කොතරම් ප්‍රමාණයකින් වැඩිවේද?

ii. පහත දක්වෙන භාණ්ඩ මත නිෂ්පාදන සහනාධාරයක් ලබාදුන් විට සහනාධාර යේ වැඩි ප්‍රතිලාභයක් හිමිවන්නේ පාරිභෝගිකයාට ද, නිෂ්පාදකයින්ටද යන්න රූප සටහන් භාවිතයෙන් තහවුරු කරන්න.

අ) භාණ්ඩයක සැපයුම් නම්‍යතාව ඉල්ලුම් නම්‍යතාවට වඩා සාපේක්ෂව <u>අඩු අගයක්</u> ගනී.

ආ) භාණ්ඩයක සැපයුම් නම්‍යතාව ඉල්ලුම් නම්‍යතාවට වඩා සාපේක්ෂව <u>වැඩි අගයක්</u> ගනී.

iii. කෘෂිකාර්මික භාණ්ඩවල මිල නිතර උච්චාවචනය වීමක් එහි ප්‍රතිඵල ලෙස ගොවීන්ගේ ආදායම් වල හටගන්නා අස්ථායීතාවනුත් බොහෝ විට දක්නට ලැබේ. ඒ සඳහා ඉදිරිපත් කල හැකි න්‍යායාත්මක පදනම පැහැදිලි කරන්න.

iv. ලෝකයේ බොහෝ රටවල් කෘෂි නිෂ්පාදන වල මිල ස්ථායී කිරීම සඳහා යොදාගනු ලබන ක්‍රියාමාර්ග කවරේ ද?

(06) i. නිෂ්පාදන ක්‍රියාවලියේදී කෙටි කාලය හා දිගු කාලය අතර වෙනස දක්වන්න. (ලකුණු 2)

ii. කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයක් යනුවෙන් අදහස් වනනේ කුමක් ද? (ලකුණු 2)

iii. ''හීනවල ඵල නීතිය'' පැහැදිලි කරන්න. එම නීතිය පදනම් කරගනු ලබන උපකල්පන සඳහන් කරන්න. (ලකුණු 4)

iv. ඍජු පිරිවැය සහ ආරෝපිත පිරිවැය අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. පූර්ණ තරඟකාරී වෙළඳපොල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ කවරේ ද? (ලකුණු 4)

vi. ආර්ථික විද්‍යාඥයින් විසින් ප්‍රාමාණික ලාභ පිරිවැයක් වශයෙන් සලකන්නේ ඇයි? (ලකුණු 4)

The National e-learning Portal for The General Education